# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம்,கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01 Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) -11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2021 – 08 - 04


ප්‍රවෘත්ති නිවේදනය - 08

**ඔස්ට්‍රේලියානු, නවසීලන්ත මහ කොමසාරිස්වරු සහ ප්‍රංශ තානාපතිවරයා මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහතා හමුවෙති.**

ඔස්ට්‍රේයානු මහ කොමසාරිස් David John Holly, නවසීන්ත මහ කොමසාරිස් Michael Edward Appleton සහ ප්‍රංශ තානාපති Eric Lavertv යන මහත්වරු අද (04) මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා හමු වූහ. මුදල් අමාත්‍යාංශයේ පැවැති මෙම හමුවේ දී අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය කර ගනිමින් තම රටවල් අතර සහයෝගීතාව ශක්තිමත් කර ගැනීම පිළිබඳව සාකච්ඡා කෙරිණි.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කාබනික වගා වැඩසටහන අගය කළ ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස්වරයා සඳහන් කළේ කාබනික පොහොර නිෂ්පදනය ඉහළ නැංවීමට අදාළ තාක්ෂණික සහය ලබා දීමට තම රජය අපේක්ෂා කරන බවයි. ශ්‍රී ලංකා මුහුදු කලාපය හරහා ඔස්ට්‍රේලියාව වෙත ළගා වන වෙළෙඳ නැව් සඳහා පහසුකම් ලබා ගැනීමට කොළඹ වරාය වැඩි වශයෙන් යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලන බව ද මහ කොමසාරිස්වරයා මෙහි දී පැවැසීය. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අවශ්‍ය සහය ලබා දීමට කටයුතු කරන බව සඳහන් කළ මහ කොමසාරිස්වරයා සත්ව ආරක්ෂණ හා සුබ සාධන පනත ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම පිළිබඳ තම රට සතුටට පත් වන බව ද පැවැසීය.

හම්බන්තොට වරාය සහ මත්තල ගුවන් තොටුපොළ ආශ්‍රිතව ස්ථාපනය කිරීමට යෝජිත අගය එකතු කළ කෘෂි නිෂ්පාදන (Value Added Agriculture Products) සඳහා වූ විශේෂ ආර්ථික කලාපය වෙත ආයෝජන සහ තාක්ෂණික සහය ලබා දීමට ඇති හැකියාව සොයා බලන ලෙස මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා මෙහි දී ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස්වරයාගෙන් ඉල්ලීමක් කළේ ය.

ශ්‍රී ලංකාවේ සිසුන් විශාල පිරිසක් ඔස්ට්‍රේලියාවේ අධ්‍යාපනය කටයුතුවල නිරත වන බව සඳහන් කළ මහ කොමසාරිස්වරයා එරට ඉහළ පෙළේ විශ්ව විද්‍යාල හා ඒවාට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතන ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීමට ඇති හැකියාව සොයා බලන බව ද වැඩි දුරටත් සඳහන් කළේ ය.

ප්‍රංශ තානාපති Eric Lavertv මහතා මෙහි දී සඳහන් කළේ කුඩා සත්ව නිෂ්පාදන ගොවිපොළ හයක් (Mini Dairy Farms) ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීමට ප්‍රංශ රජය කටයුතු කර ඇති අතර ඉන් හතරක කටයුතු අවසන් අදියරට ළඟා වී ඇති බවයි. සංචාරක කර්මාන්තය යළි සක්‍රිය කිරීමේ දී ශ්‍රී ලංකාවට අවශ්‍ය සහය ලබා දීමට කැමැත්ත පළ කළ තානාපතිවරයා

ගුණාත්මකභාවයෙන් ඉහළ ලංකා තේ සඳහා ප්‍රංශ වෙළෙඳ පොළ තුළ වැඩි අවස්ථාවක් ලබා දීමට අවශ්‍ය පහසුකම් සැපයීමට අපේක්ෂා කරන බව ද වැඩි දුරටත් පැවැසීය.

මෙහි දී මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා හමු වූ නවසීලන්ත මහ කොමසාරිස් Michael Edward Appleton මහතා, ශ්‍රී ලංකාව සහ නවසීලන්තය අතර අධ්‍යාපන සහ ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි අන්‍යෝන්‍ය සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට අපේක්ෂා කරන අතර ම එම ක්ෂේත්‍රයන්හි උන්නතිය වෙනුවෙන් අඛණ්ඩව සහය ලබා දීමට අපේක්ෂා කරන බව ද පැවැසීය. මෙරට පශු සම්පත් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමට තම රජය කැමැත්තෙන් පසු වන බව ද මහ කොමසාරිස්වරයා මෙහි දී වැඩි දුරටත් සඳහන් කළේ ය.

පවතින තත්ත්වය හමුවේ ආර්ථික සහ සමාජීය කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම සඳහා සිය මිත්‍ර රටවලින් ලැබෙන සහය නිරන්තරයෙන් අගය කරන බව සඳහන් කළ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ රජය සෙසු රටවල් සමග නොබැඳි පිළිවෙතට මුල් තැන දෙමින් සුහදශීලීව කටයුතු කිරීමට කැප වන බව ද පැවැසීය.

**මාධ්‍ය ඒකකය,**
**මුදල් අමාත්‍යාංශය**